ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ගෞරව(විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)උපාධි වැඩසටහන

6 වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය - 2021

ළමා අයිතිවාසිකම් - SNU6223/ESU4123

කාලය- පැය තුනයි. (03)

---

දිනය - 2021.05.02      වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ළමා අයිතිවාසිකම් සම්මුතිය යනු කුමක් ද? ළමා අයිතිවාසිකම් පිළිබඳව එම සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ ක්‍රි.ව.1925 – 2000 දක්වා කාලය තුළ සම්මත කර ගනු ලැබූ ළමා අයිතිවාසිකම්වලට අදාල ආඥා පනත් පහක් (05) නම් කරන්න.

03. විශේෂ තත්ත්වයේ පසුවන දරුවන් ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා කර ගැනීමට රජයට ගත හැකි පියවර හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

04. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා සපයා ඇති සේවාවන් තුනක් (03) ලියන්න.

05. දරුකමට හදා ගැනීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

06. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපන තත්ත්වය නංවාලීමට ශ්‍රී ලංකා රජයට සහාය විය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

07. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමෙන් අත්වන වාසි පහක් (05) ලියන්න.

08. කොවිඩ් 19 වසංගත තර්ජනයෙන් විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා ගුරුවරයෙකුට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග පහක් **(05)** යෝජනා කරන්න.

(ලකුණු 5 X 8 = 40)

<u>2 වන කොටස</u>

09. (I) ළමා අයිතිවාසිකම් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(II) පුරාණ ලංකාවේ (යටත් විජිත යුගයට පෙර) ළමා අයිතීන් සම්බන්ධව පැවැති තත්ත්වය විස්තර කරන්න. (ලකුණු 07)

(III) ශ්‍රී ලාංකික ළමයින්ගේ ළමා අයිතිවාසිකම් සුරැකීමට බ්‍රිතාන්‍ය යුගයේ ගනු ලැබූ ක්‍රියාමාර්ග විභාග කරන්න. (ලකුණු10)

10. (I) විශේෂ අවශ්‍යතා සහිත ළමයින් යනු කවුරුන් ද? (ලකුණු 04)

(II) විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ රැකවරණය සඳහා දෙමාපියන් වෙත පැවරෙන වගකීම් තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) ඉහත සඳහන් කළ වගකීම් ක්‍රියාත්මක කිරීමේදී දෙමාපියන් මුහුණ දෙන ගැටලු තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 10)

11. "විශේෂ තත්ත්වයේ පසුවන ළමයින්ගේ සෞඛ්‍යය හා රැකවරණ තත්ත්වය නංවාලීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට උදව්විය හැකිය."

(I) රාජ්‍ය නොවන සංවිධානවලට ඉහත ළමයින්ගේ සෞඛ්‍යය හා රැකවරණයට උදව්විය හැකි ආකාර පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(II) මෙම තත්ත්වයන්හි දී රාජ්‍ය නොවන සංවිධාන මුහුණ දෙන ගැටලු මොනවා ද? (ලකුණු 05)

(III) ඔබ ඉහත සඳහන් කළ ගැටලු අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. (I) ළමයින්ගේ සුරක්ෂණ අයිතිය යනු කුමක් ද? (ලකුණු 03)

(II) පාසල තුළ විශේෂ අවශ්‍යතා ඇති ළමයින්ගේ සුරක්ෂණ අයිතිය සහතික කිරීම සඳහා ගුරුවරුන්ට ගත හැකි ක්‍රියාමාර්ග අවම තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 07)

(III) "ළමයින්ගේ සුරක්ෂණ අයිතිය පිළිබඳ දැනුවත්භාවය ඉහල නැංවීමෙහිලා පූජ්‍ය පක්ෂයට වැදගත් භූමිකාවක් ඇරිය හැකිය."

ඔබ මෙම වගන්තිය සමඟ එකඟ වේ ද? සැකෙවින් අදහස් දක්වන්න. (ලකුණු 10)

13. "පාසල තුළදී විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සහභාගිත්ව අයිතිය සුරැකීම සඳහා ගුරුවරුන් සතු කාර්යභාරය අසීමිත වේ."

(I) 'සහභාගිත්ව අයිතිය' යනු කුමක් ද? (ලකුණු 02)

(II) පාසල තුළදී, විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සහභාගිත්ව අයිතිය සුරැකීමට ගුරුවරයාට ගතහැකි පියවර මොනවා ද? (ලකුණු 08)

(III) එහිදී ගුරුවරයා මුහුණ දෙන ගැටලු තුනක් **(03)** හා ඒවා අවම කිරීමට සුදුසු යෝජනා සැකෙවින් දක්වන්න. (ලකුණු 10)

14. (I) ශ්‍රී ලංකා රජය විසින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ළමා අයිතීන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ගෙන ඇති මූලික පියවර තුනක් **(03)** ලියන්න. (ලකුණු 06)

(II) ඉහත පියවර ක්‍රියාත්මක කිරීමේදී රජය මුහුණ දුන් ගැටලු තුනක් **(03)** කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

(III) ඉහත සඳහන් කරන ලද ගැටලු මගහරවා ගැනීමට යෝජනා (අවම 4ක්) සකස් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.